# භාවනා ගුණ

බුද්ධශ්‍රාවක ධර්මපීඨයේ කථිකාචාර්ය

බෝධිනාගල අභයරේවත ස්ථවිර

නමොතස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

**"ඒකායනො අයං භික්ඛවෙ මග්ගො සත්තානං විසුද්ධියා, සොකපරිද්දවානං සමතික්කමාය, දුක්ඛ දෙමනස්සානං අත්ථඞ්ගමාය, ඤායස්ස අධිගමාය, නිබ්බාණස්ස, සච්චකිරියාය යදිදං චත්තාරො සතිපට්ඨානා"**

මහණෙනි, යම් මේ සතර සතිපට්ඨාන (ධම්ම) කෙනෙක් වෙත්ද මේ මාර්ගය (මේ භාවනා ක්‍රමය) රාගමලාදියෙන් කිලිටිවූ සත්වයන්ගේ චිත්ත පාරිශුද්ධිය (සිතේ පිරිසිදුකම) පිණිස, ශෝකයාගේ හා පරිදේවයාගේ ඉක්මවීම පිණිස, කායික දුක හා චෛතසික දෙම්නස අතුරුදගන් කිරීම පිණිස, ආර්ය අෂ්ඨාංගික මාර්ගයාගේ අවබෝධය පිණිස, නිර්වාණය ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස එකම (ප්‍රතිපද) මාර්ගය වේ.

උවදුරු සතරක් දුරුකරමින් විශේෂ ආනිසංස තුනක් ලබාදෙමින් පවත්නා සතිපට්ඨාන භාවනා ක්‍රමය සර්වඥයන් වහන්සේ විසින් යථෝක්ත ආරම්භක දේශනාවෙන් වදරා ඇත. එය අනුගමනය කළයුතු පිළිවෙල ඉගෙනීම, පිරිවැහීම, කීම, දැරීම සහ භාවනා වශයෙන් වැඩීම යනුවෙන් දක්වේ.

සිහිය හා විමසුම් නුවණ මේ සඳහා උපස්ථම්භක වේ. මෙහි සිහිය (සතිය) සමථ නමින්ද, විමසුම් නුවණ (සම්පජඤ්ඤය) විපස්සනා නමින්ද, දැනගත යුතුයි.

ලෝක සත්වයා වාසය කරනුයේ විපත්ති, ආපද, අලාභ, හානි, වියෝග ගෙනදෙන තැනකය. කාම, රූප, අරූප වශයෙන් පවත්නා එය ස්කන්ධ ධාතු ආයතන සම්බන්ධවූ සංසාරය නමින් බුදු නුවණින් දක්නා ලදී. විපත්ති ආදීයෙන් සෝක පරිදේව ආදිය ගෙනදීම එහි ස්වභාවයයි. නිස්සෝකී තත්වයෙන් හෙවත් කණගාටු නොවී සතුටින් වාසය කිරීමට ලැබේනම් අප කවුරුත් බෙහෙවින්ම කැමැතියි. නමුත් එම තත්වයෙන් සුළු කලක් හෝ ගෙවා ගැනීමේ හැකියාවක් අපට නැත. හැමවිටම හදවත දැවී තැවී පලුදුවී වේදනාවෙන් පීඩාවට පත්වන දේ නොයෙක් වෙසින් අප කරා පැමිණේ. පත්වූ පීඩාව (ඉරණම) කුමක්දැයි නොදන්නා අය බොහෝය. සුගත් දම් අසන්නෝ ඉරණම් දන්නෝය. ඉරණම් දන්නෝ සිහියෙන් වෙසෙන්නෝය. සිහියෙන් වෙසෙන්නෝ සන්සිඳීමට පත්වෙති. සන්සිඳීමට පත්වන්නකු හට විමසුම් නුවණින් කටයුතු කළ හැකි වේ.

ජීවිතයට සම්බන්ධවූ සිරුර ගැනත් විඳින්නට ලැබෙන දේ ගැනත් පහලවන සිත් ගැන හා සිතුවිලි පරම්පරා ගැනත් සිහිය යොමු කොට ඉන්නට අප විසින් අවස්ථා ලබාගන්නේ නම් බොහෝ සෙයින් සෝකවන ජනයා අතර එය සීමාකර ගැනීමට අපට හැකිවේ. මේ තත්වය (සෝකාදියට පත්වීම) වැලැක්වීමට ක්‍රමයක් අප අනුගමනය නොකළොත් ඇතුලත දවමින් තිබුණ තත්වය වචන මාර්ගයෙන්ද පිටකරමින් මහත් සේ වැලපීමට පත්වේ.

සුළු වශයෙන් හෝ නෑයින් නැති කෙනෙක් ලොව නැත. සුළු වශයෙන් හෝ වස්තු නැති කෙනෙක්ද ලොව නැත. එසේම නොමියන නෑයින් ලබා උපන් කෙනෙක්ද, නොනැසෙන වස්තු ලබා උපන් කෙනෙක්ද ලොව නැත. එහෙයින් සෝක පරිදේවයන්ගෙන් මිදීමටද කාහටවත් නොහැකිය. කායික වශයෙන් පවත්නා රෝගාබාධ වැනි අමිහිරි දේට හසු නොවන ජීවිතයක්ද සොයා ගත නොහැක. සිත් වේදනා නමින් කියැවෙන මානසික අමිහිරි අවස්ථාවන්ට පත් නොවන ජීවිතද එසේම නැත.

කෙතරම් වස්තු සම්පත් තිබුණත් සුවකළ නොහැකි රෝගයකට හසුවීමෙනුත්, හදිසි අනතුරු නිසාත්, බාහිර උපක්‍රම නිසාත්, කයට දුක් වේදනා නොපැමිණෙන්නන්ද සොයා ගැනීම අපහසුය. දහසක් පැතුම් ඇතිවන සිතක ඒ සියල්ලම සපුරාලමින් කටයුතු කරන්නට ලැබී ඇති කෙනෙක් එසේම විරලයහ.

මේ නිසා සිත් තැවුල් නොමැතිවීමටත්, විලාප හඬ නොනැගීමටත්, අමිහිරි සිරුරු දුක් නොවීමටත් අමිහිරි මානසික දුක් නොවීමටත්, මුණි රාජයන් වහන්සේ විසින් ඒකායන මාර්ගය වශයෙන් වදළ "ගතයුතු එකම මග" සතිපට්ඨාන භාවනා මාර්ගයයි.

මෙකී උවදුරු වලින් වලක්වා මේ මාර්ගය ඉගෙණ පිරිවනා අසා දරා නිතර නිතර භාවනාකොට සත් දිනක් ඇතුළත පවා විශුද්ධියට පත්වී, නිවැරදි මග දැන, ශාන්ත භාවයට, (නිර්වාණාධිගමයට) පත් වන්නට හැකියාව ඇති බව තමන් වහන්සේ "පාටිභෝග" භාවයෙහි සිට වදළ බව වෙසෙසින් දත යුතුයි.

සතර සතිපට්ඨාන භාවනා මාර්ගය දේශනා, කිරීමට පෙර එහි අනුසස් දක්වා පළමුව ගුණ වර්ණනාවක යෙදුන තථාගතයන් වහන්සේ එසේ සිදුකරණ ලදුයේ ශ්‍රාවක ජනයන් මේ මගෙහි (භාවනායෙහි) උත්සාහවත් කරලීම සඳහායි. එහෙයින් ලෞකික ලෝකෝත්තර වශයෙන් පවත්නා සත් වැදෑරුම් ආනිසංස ගුණ ලබාගැනීම සඳහා අප කවුරුනුත් සතිපට්ඨාන භාවනා වැඩීමෙහි උත්සාහවත් විය යුතුයි.

"සබ්බසො නාම රූපස්මිං – යස්ස නත්ථි මමායිතං
අසතා ච න සොචති – ස වෙ ලොකෙ නජීයති"

යමෙක් හට සර්ව ප්‍රකාරයෙන්ම නාම රූපයන් කෙරෙහි මමය මාගේ යයි මමත්වයක් නැත්තේද, රූප ශබ්දදී අරමුණු නිසා සෝක නොකෙරේද, පරිදේවයට නොපැමිණේද, හෙතෙම ලෝකයෙහි කිසිසේත් නොපිරිහෙන්නේය. (දික් සඟි අටුවාව)

නිබ්බාන පච්චයො හොතු.

---

ගමනෙන න පත්තබ්බො – ලොකස්සන්තො කුදචනං
න ච අප්පත්වා ලොකන්තං – දුක්ඛා අත්ථි පමොචනං

තස්මා හවෙ ලොකවිදූ සුමෙධො
ලොකන්තගූ වුසිත බ්‍රහ්ම චරියො
ලොකස්ස අන්තං සමිතාවි ඤත්වා
නාසිංසති ලොකමිමං පරඤ්චාති

කිසි කලෙක පා ගමනින් ලෝකාන්තයට හෙවත් නිවණට යා නොහැකිය. නිවනට නොපැමිණ දුකින් මිදීමක් ද නොමැත.
එහෙයින් ලෝකය දැනගත් ප්‍රඥා ඇති, නිවනට ගිය, වැස නිමවූ බඹසර ඇති සන්සිඳ වූ කෙලෙස් ඇති රහතන් වහන්සේ ලෝකාන්තය දැන මෙලොව පරලොව නොම පතයි.

(සංයුත්ත නිකාය රෝහිතස්ස සූත්‍රය)